ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 160/18 — 1975 අප්‍රේල් 19 වැනි සෙනසුරාදා — 1975.04.19

(ආඥාවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

ආණ්ඩුවේ නිවේදන

ජන්‍ය. කෘ. අංකය : ඩබ්ලිව්. 68(50)/75.

(40 වන අධිකාරය වූ) මහාජන ආරක්ෂක ආඥාපනත

අගමැතිගේ නිර්දේශය අනුව මහාජන ආරක්ෂක ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලැබූ නියෝග.

වී. ගොපල්ලව,
ජනාධිපතිවරයා.

1975 අප්‍රේල් මස 19 වැනි දින,
නුවරඑළිය, ජනාධිපතිවරයාගේ කාර්‍යාලයේ දී ය.

නියෝග

1. මේ නියෝග 1975 අංක 4 දරන භදිසි අවස්ථා (රජයේ ඉඩම් පැහැර ගැනීම් පිළිබඳ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. අගමැති විසින්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, ශ්‍රී ලංකාවෙහි යම්කිසි ප්‍රදේශයක් මේ නියෝග අදාළ විය යුතු ප්‍රදේශයක් ලෙස කලින් කල ප්‍රකාශ කළ හැකිය. එවැනි ප්‍රදේශයක් මින් මතු මේ නියෝගවල " නිවේදිත ප්‍රදේශයක්" වශයෙන් හඳුන්වනු ලැබේ.

3. (1) 1972 ජූනි මස 1 වන දිනට පසු යම් අවස්ථාවක, යම් තැනැත්තකු තමා විසින් හෝ තම අනුයෝජිකයා මගින් යම් නිවේදිත ප්‍රදේශයක පිහිටි යම් රජයේ ඉඩමක් පැහැර ගෙන ඇතැයි, හෝ නීති විරෝධී ලෙස—

(අ) ඒ මත වැටක්, ගොඩනැගිල්ලක් හෝ වෙනත් ඉදිකිරීමක් තැනීම ; හෝ

(ආ) එහි යම් ගොවිපලක් පැවැත්වීම හෝ වගාවක් කිරීම ; හෝ

(ඇ) එහි යම් දුව කැපීමක් කිරීම ; හෝ

(ඈ) එහි යම් ජලමාර්ග අන් අතකට හැරවීම ; හෝ

(ඉ) එහි යම් කැලයක් ගිනිතැබීම ; හෝ

(ඊ) එහි පස බිඳීම ; හෝ

(උ) ඒ රජයේ ඉඩමෙහි මෑඉම වෙනස් කිරීම ; හෝ

කර ඇතැයි දිසාපතිවරයා හෝ තත් කාර්යය සඳහා අගමැති විසින් බලය පවරනු ලැබූ රාජ්‍ය නිලධරයකු (ඒ නිලධරයා මේ නියෝග වල මින් මතු " බලය ලත් නිලධරයා " යනුවෙන් සඳහන් කරනු ලැබේ) අදහස් කරන අවස්ථාවක, ඒ දිසාපතිවරයා විසින් හෝ බලය ලත් නිලධරයා විසින් ඒ බවට සහතිකයක් පොලිස් පරීක්ෂකයකුගේ තත්ත්වයට නොඅඩු තත්ත්වයක පොලිස් නිලධරයකුට නිකුත් කළ හැකිය.

(2) දිසාපතිවරයා විසින් හෝ බලය ලත් නිලධරයා විසින් යම් තැනැත්තකු සම්බන්ධයෙන් (1) වන ඡෙදය යටතේ සහතික ය් නිකුත් කරනු ලැබේ ද ඒ තැනැත්තා මේ නියෝගවල මින් මතු " පැහැර ගත් තැනැත්තා " යනුවෙන් සඳහන් කරනු ලැබේ.

(3) දිසාපතිවරයා විසින් හෝ බලය ලත් නිලධරයා විසින් (1) වන ඡෙදයෙහි සඳහන් සහතිකය නිකුත් කරනු ලැබීමට පෙර, පැහැර ගත් තැනැත්තාට ඔහුගේ නිදහසට කරුණු කියා සිටීමේ අවස්ථාවක් දීමේ කාර්යය සඳහා අවශ්‍ය යැයි දිසාපතිවරයා හෝ බලය ලත් නිලධරයා සලකන විභාගයක් ඔහු විසින් පැවැත්විය යුතුය.

57A—ඒ 13603—2,100 (75/04)

(4) (3) වන ඡෙදය යටතේ විභාගයක් පැවැත්වීමේ කාර්යයන් සඳහා, පැහැර ගත් කැනැත්තා වෙත දැන්වීමක් භාරදීම හෝ භාර දෙනු ලැබීමට සැලැස්වීම දිසාපතිවරයා විසින් හෝ බලය ලත් නිලධරයා විසින් කළ යුතුය. පැහැර ගත් කැනැත්තාට පෞද්ගලිකවම දැන්වීමක් භාරදීමට හෝ භාර දෙනු ලැබීමට සැලැස්වීමට දිසාපතිවරයාට හෝ බලය ලත් නිලධරයාට නොහැකි අවස්ථාවක ප්‍රශ්නයට භාජන වී ඇති ඉඩමෙහි ප්‍රකට ස්ථානයක අලවනු ලැබූ දැන්වීමක්, පැහැර ගත් කැනැත්තා වෙත කරන ලද ප්‍රමාණවත් දැන්වීමක් ලෙස සැලකිය යුතුය.

4. (1) පැහැර ගත් කැනැත්තා ප්‍රශ්නයට භාජන වී ඇති රජයේ ඉඩමෙන් නෙරපීමටත් ඒ ඉඩමෙහි ඇති යම් වැටක්, ගොඩ නැගිල්ලක් හෝ වෙනත් ඉදි කිරීමක් හෝ කඩා දැමීමක් ඒ ඉඩමෙහි තිබෙන ආවුද, උපකරණ, එහි සිටින ඇති කරන සතුන් හෝ එහි යම් වගාවක පලදුව රාජ්‍ය සන්තක කිරීමක් දිසාපතිවරයාගෙන් හෝ බලය ලත් නිලධරයාගෙන් 3 වන නියෝගය යටතේ වූ සහතිකය ලබන පොලිස් නිලධරයාගේ කාර්යය වන්නේය.

එසේ වුවද තමාගේ නීත්‍යානුකූල අයිතිවාසිකම්වල බලගීන වන පරිදි කමත් නෙරපනු ලැබීමෙන් හෝ තම දේපළ රාජ්‍ය සන්තක කරනු ලැබීමෙන් අසහනයට පත් වන පැහැර ගත් කැනැත්තකු විසින් තම සන්තකය ආපසු දෙන ලෙස හෝ අලාභ ගෙවන ලෙස හෝ අයදිමින් රජයට විරුද්ධව උචිත අධිකරණයක සිවිල් නඩුවක් පැවරිය හැකිය.

(2) (1) වන ඡෙදයෙහි සඳහන් පොලිස් නිලධරයා විසින්, මේ නියෝගය යටතේ තම කාර්ය ඉටු කිරීමේ දී, යුක්තිසහගතව අවශ්‍ය යැයි තමා සලකන බලයක් පාවිච්චි කිරීම ද පොලිස් හමුදාවේ වෙනත් යම් සාමාජිකයන්ගේ සහාය ඉල්ලා ලබා ගැනීම ද කළ හැකිය.

5. පැහැර ගත් කැනැත්තාට විරුද්ධව වෙන යම් ලිඛිත නීතියක් යටතේ යම් නඩුවක් පැවරීම හෝ යම් නඩු ක්‍රියාවක් පවත්වාගෙන යෑම මෙම නියෝගවල ඉහතින් දක්වෙන විධිවිධාන කිසිවකින් තහනම් වන ලෙස අර්ථ නොගත යුතුය.

6. (1) පැහැර ගත් කැනැත්තාට විරුද්ධව ඉඩම් සංවර්ධන ආඥාපනත, කැලෑ ආඥාපනත, රජයේ ඉඩම් ආඥාපනත හෝ රජයේ ඉඩම් පැහැර ගැනීම පිළිබඳ ආඥාපනත යටතේ යම් අධිකරණයක නඩු පවරනු ලැබූ අවස්ථාවක, වෙන යම් නීතියක කුමක් සඳහන් වුව ද ඒ නඩු කටයුතු අවසාන වන තෙක් පැහැර ගත් කැනැත්තා සිරහාරයේ තැබීම ඒ නඩු පවරනු ලැබුවේ යම් විනිශ්චය කාරවරයකු ඉදිරියේ ද ඒ විනිශ්චයකාරවරයාගේ කාර්ය වන්නේය.

(2) පැහැර ගත් කැනැත්තාට විරුද්ධව 1972 ජූනි මස 1 වන දින හා මෙම නියෝග ක්‍රියාත්මක වන දිනය හා අතර කාලය තුළ ඉඩම් සංවර්ධන ආඥාපනත, කැලෑ ආඥාපනත, රජයේ ඉඩම් ආඥාපනත හෝ රජයේ ඉඩම් පැහැර ගැනීම පිළිබඳ ආඥාපනත යටතේ යම් අධිකරණයක යම් කිසි නඩු කටයුත්තක් ආරම්භ කරනු ලැබ ඇති අවස්ථාවක, පැහැර ගත් කැනැත්තා අත් අඩංගුවට ගෙන, ඒ නඩු පැවරීම කරන ලද්දේ යම් විනිශ්චයකාරවරයකු ඉදිරියේ ද ඒ විනිශ්චයකාරවරයා වෙත ඔහු ඉදිරිපත් කරන ලෙස හෝ එසේ අත් අඩංගුවට ගැනීමට හා ඉදිරිපත් කිරීමට සලස්වන ලෙස පොලිස් පරීක්ෂකවරයකුගේ තත්ත්වයට නොඅඩු පොලිස් නිලධරයකුට දිසාපතිවරයා විසින් හෝ බලය ලත් නිලධරයා විසින් විධාන කළ හැකිය. එසේ ඉදිරිපත් කරන ලැබූ විට එම, විනිශ්චයකාරවරයා ඉදිරියේ ඇති නඩු කටයුතු අවසාන වනතුරු පැහැර ගත් කැනැත්තා වෙන යම් නීතියක කුමක් සඳහන්ව ඇතද, සිරහාරයේ තැබීම එම විනිශ්චයකාරවරයාගේ කාර්ය වන්නේය.

(3) (අ) පැහැර ගත් කැනැත්තා මුදහැරීමට නීතිපතිවරයා ඔහුගේ ලිඛිත කැමැත්ත දෙතහොත්, හෝ

(ආ) පැහැරගත් ඉඩම් විනිශ්චයකාරවරයා නිශ්චය කරන දිනයකට පෙර අත්හැර යෑමට පැහැරගත් කැනැත්තා විනිශ්චය කාරවරයාට ලිඛිත පොරොන්දුවක් දෙතහොත්, හෝ

පැහැර ගත් කැනැත්තාට විරුද්ධව නඩු කටයුතු ආරම්භ කර ඇත්තේ යම් විනිශ්චයකාරවරයකු ඉදිරියේ ද ඒ විනිශ්චයකාරවරයා විසින් තමා යුක්තිසහගතයයි සලකන ඇප පිට (1) හා (2) ඡෙදවල විධිවිධාන ගැන නොතකා පැහැර ගත් කැනැත්තා මුදා හැරිය හැකිය.

7. පැහැර ගත් කැනැත්තාට විරුද්ධව ඉඩම් සංවර්ධන ආඥාපනත හෝ කැලෑ ආඥාපනත හෝ රජයේ ඉඩම් ආඥාපනත හෝ රජයේ ඉඩම් පැහැර ගැනීම පිළිබඳ ආඥාපනත යටතේ යම් අධිකරණයක යම් නඩුවක් පවරනු ලැබූ අවස්ථාවක, එම නඩුව, එය පවරන ලද්දේ යම් අධිකරණයක් ඉදිරියේ ද ඒ අධිකරණයෙන් ශ්‍රී ලංකාවේ වෙනයම් අධිකරණයකට මාරු කිරීම යෝග්‍ය යැයි නීතිපති අදහස් කරතහොත් ඒ නඩුව වෙන යම් අධිකරණයකට මාරු කරන ලෙස ඔහු විසින් ඔහුගේ ආඥප්තියෙන් නියම කිරීම නීත්‍යානුකූල වන්නේය.

8. (1) ඉඩම් සංවර්ධන ආඥාපනතේ හෝ කැලෑ ආඥාපනතේ හෝ රජයේ ඉඩම් ආඥාපනතේ හෝ රජයේ ඉඩම් පැහැර ගැනීම පිළිබඳ ආඥාපනතෙහි යම් විධිවිධානයක් කඩ කරමින් ක්‍රියා කිරීමට යම් පැහැර ගත් කැනැත්තකුට ආධාර දෙන හෝ අනුබල දෙන කවර කැනැත්තකු වුව ද වරදකරුවකු වන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දෙකකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන්ම එක් ආකාරයක බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාර ගත කරනු ලැබීම යන දඬුවම් දෙකටම ඔහු යටත් වන්නේය.

(2) (1) ඡෙදය යටතේ යම් වරදක් සම්බන්ධයෙන් චෝදනා කරනු ලැබූ කවර කැනැත්තකු වුව ද මහේස්ත්‍රාත්වරයකු ඉදිරියට ගෙන එනු ලැබූ විට තමා ඉදිරියේ ඇති නඩු කටයුතු අවසාන වන තුරු මහේස්ත්‍රාත්වරයා විසින් ඔහු සිරහාරයේ තැබිය යුතුය :

එසේ වුවද, ඒ වරදකරු මුදා හැරීමට නීතිපති ඔහුගේ ලිඛිත කැමැත්ත දෙතහොත්, මහේස්ත්‍රාත්වරයා විසින් යුක්තිසහගතයයි සලකන ඇප පිට එම වරදකරු මුදා හැරීම නීත්‍යානුකූල වන්නේය.

(3) 1975 අංක 4 දරන හදිසි අවස්ථා (විවිධ විධිවිධාන හා බලතල) නියෝගවල 58 වන නියෝගය යටතේ කම්බලතල අනුව ක්‍රියා කරමින් නීතිපතිවරයා විසින්—

(අ) මේ නියෝගය යටතේ යම් නඩුවක් පවරන ; හෝ

(ආ) මේ නියෝගය යටතේ නඩුවක් පැවරීම අනුමත කරන

අවස්ථාවක, ප්‍රශ්නයට භාජනව ඇති නිවේදිත ප්‍රදේශයෙන් පිටත පිහිටි යම් අධිකරණයක එම නඩුව පැවරීම හෝ එම අධිකරණයෙහි එය පැවරීමට අනුමතය දීම යෝග්‍ය යැයි නීතිපතිවරයා අදහස් කරතහොත් නීතිපතිවරයා විසින් එසේ කිරීම නීත්‍යානුකූල වන්නේය.

9. මේ නියෝග යටතේ කරන ලද හෝ කරන ලදැයි සැලකෙන යම් දෙයක් සම්බන්ධයෙන් යම් රාජ්‍ය නිලධරයකුටත් විරුද්ධව කිසිම අධිකරණයක කිසිදු සිවිල් හෝ අපරාධ නඩුවක් පැවරීම හෝ පවත්වා ගෙන යාම නොකළ යුතුය.

10. දිසාපතිවරයා විසින් මේ නියෝග යටතේ තම බලතල හෝ කාර්යයන් අතුරින් කිසිවක් තම පරිපාලන දිස්ත්‍රික්කයේ යම් මාණ්ඩලික නිලධරයකු වෙත ලියවිල්ලකින් පවරනු ලැබිය හැකිය.

11. මේ නියෝගවල—

" දිසාපති " යන්නෙන් නිවේදිත ප්‍රදේශයක පරිපාලන බලය හිමි දිසාපතිවරයකු අදහස් වන අතර, මේ නියෝග යටතේ දිසාපතිවරයා විසින් තම බලතල හෝ කාර්යයන් පවරා දෙනු ලබන යම් මාණ්ඩලික නිලධරයෙක් ද එයට ඇතුළත්වේ.

" මාණ්ඩලික නිලධරයා " යන්නෙන් වැටුප් ක්‍රමයෙහි ආරම්භකය වර්ෂයකට රුපියල් 6,720 කට අඩු නොවන්නා වූ යම් ධුරයක් දරන යම් රාජ්‍ය නිලධරයෙක් අදහස් වේ.

" රජයේ ඉඩම " යන්නෙහි කැලෑ ආඥාපනතේ 78 වන වගන්තියෙහි අර්ථකථිත " රජයට කැමැත්තක් කළ හැකි ඉඩම " යන අර්ථයම ඇත.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී